Australian Government
Department of Health

# ක්ෂය රෝගය (TB) පරීක්ෂණය සහ ප්‍රතිකාර ගැන ජාත්‍යන්තර ශිෂ්‍යයන්ට උපදෙස්

## ක්ෂය රෝගය වැළඳීමේ වැඩි අවදානම

සමහර ජාත්‍යන්තර ශිෂ්‍යයන්ට ක්ෂය රෝගය වැළඳීමට ඇති ඉඩකඩ ඕස්ට්‍රේලියාවේ ඉපදුන පුද්ගලයන්ට වඩා වැඩිය.

ඔබ පහත සඳහන් ප්‍රදේශ වල රටකින් පැමිනෙන්නෙක් නම්, ඔබ ක්ෂය රෝගයට නිරාවරණය වී තිබීමට ඉඩ ඇත:

- ආසියාව
- අප්‍රිකාව
- බටහිර පැසිෆික්
- ඉන්දියානු උප මහද්වීපය
- දකුණු ඇමෙරිකාව
- නැගෙනහිර යුරෝපය.

මේ ප්‍රදේශ වලින් පැමිණෙන්නන් ක්ෂය රෝගය ආසාදනය වීමට සහ එයින් රෝගී වීමට වැඩි අවදානමක සිටී.

## ක්ෂය රෝගය යනු කුමක්ද?

ක්ෂය රෝගය යනු  පෙනහළු, අනිකුත් අවයව සහ අස්ථි වලට බලපාන බෝවෙන රෝගයකි. එය ඖෂධ වලින් සුවකළ හැකිය. එහෙත් ප්‍රතිකාර නොගෙන සිටියොත් මාරාන්තික විය හැකිය. ලෝකයේ ජනගහනයෙන් හතරෙන් එකක් පමණ ක්ෂය රෝගයට හේතුකාරක බැක්ටීරියාවෙන් ආසාදනය වී සිටී.

ක්ෂය රෝගය ලෝකයේ මරණ සිදුකරන  ඉහලම හේතු  දහයෙන් එකකි

## ක්ෂය රෝගය සඳහා ප්‍රතිකාර නොමිලේ සැපයේ

ඕස්ට්‍රේලියාවේ මහජන සෞඛ්‍ය පද්ධතිය තුළ සිදු කරනු ලබන ක්ෂය රෝගය රෝග විනිශ්චය හෝ ප්‍රතිකාර සේවා, ඖෂධ ද ඇතුළුව, ඔබට ගාස්තුවක් නොගෙවා ලබා ගත හැකිය. විදේශ ශිෂ්‍යයන්ගේ සෞඛ්‍ය රක්ෂණය [Overseas Student Health Cover (OSHC) ] මඟින් පෞද්ගලික සෞඛ්‍ය පද්ධතිය හරහා ලබාදෙන ක්ෂය රෝග සේවා සඳහා වැයවන සමහරක් වියදම් ආවරණය කරනු ඇත.

## වීසා සඳහා මෙයින් බලපෑමක් නැත

ඔබට ක්ෂය රෝගය වැළඳුනහොත්, ඕස්ට්‍රේලියාවෙන් පිටමන් වන ලෙස ඔබෙන් ඉල්ලා නොසිටී. ඔබ ක්ෂය රෝගය සඳහා නිර්දේශිත ප්‍රතිකාර ලබා ගතහොත් , ඔබේ ශිෂ්‍ය වීසා බලපත්‍රයේ කොන්දේසි වලට එය බල පාන්නේ නැත.

## රෝග ලක්ෂණ

ක්ෂය රෝගය වැළඳුන පුද්ගලයන්ට පහත පෙනෙන රෝග ලක්ෂණ හට ගැනීමට පුළුවන:

- තෙහෙට්ටු සහ අසනීප ගතිය
- අඩු ගණනේ සති 3ක් වත් පවතින කැස්ස
- හේතුවක් නැතුව බර අඩු වීම
- උණ ගැනීම
- රාත්‍රියට සයනයේදී දහඩිය දැමීම
- කැස්ස සමග ලේ පිටවීම
- පපුවේ කැක්කුම
- වසා ග්‍රන්ථි ඉදිමුම
- අහාර රුචිය නැතිවී යාම.

ඔබට මෙයින් කිසියම් රෝග ලක්ෂණයක් තිබේ නම්, වෛද්‍යවරයෙක් හමුවී මේ තොරතුරු පත්‍රිකාව පෙන්වන්න.

සක්‍රිය ක්ෂය රෝගය තිබෙන සමහරුන්ට රෝග ලක්ෂණ හට නොගනී.

## ක්ෂය රෝගය පැතිරෙන්නේ කෙසේද

සක්‍රිය ක්ෂය රෝගය සහිත පුද්ගලයෙක් කහින විට, කිවිසුම් හරින විට, කැ ගහන විට, කතා කරන හෝ ගී ගයන විට, ඒ ළඟ සිටින වෙනත් උදවිය එම වාතයේ ඇති බැක්ටීරියා ආශ්වාස කිරීම හරහා ක්ෂය රෝගය පැතිරේ.

ඔබට නොදැනුවත්වම ඔබ ක්ෂය රෝගයට නිරාවරණය වී සිටීමට ඉඩ තිබේ .

ක්ෂය රෝගය සහිත සමහර පුද්ගලයන් ට රෝග ලක්ෂණ හට නොගන්නවා මෙන්ම ඔවුන්ට සක්‍රිය ක්ෂය රෝගය වැළදී ඇති බවද ඔවුන් නොදැන සිටිය හැකිය.

## එන්නත

ක්ෂය රෝග එන්නත (BCG) මගින් ළදරුවන්ව උග්‍ර ක්ෂය රෝග ප්‍රබේධ වලින් ආරක්ෂා කරනු ලැබේ. එන්නත ලබා සිටියද ඔබට ක්ෂය රෝගය වැළදීමට පුළුවන.

## ක්ෂය රෝග පරීක්ෂා කිරීම්

ඉහල අවදානමක් ඇති රටවලින් පැමිණෙන පුද්ගලයන් තුළ සක්‍රීය හෝ බෝවෙන ක්ෂය රෝගය තිබේදැයි බැලීම සඳහා, වීසා වෛද්‍ය පරීක්ෂණයට පපුවේ එක්ස් රේ විකිරණ ජායාරූපයක් ගැනීම අඩංගු වේ.

වෛද්‍යවරුන්ට පපුවේ එක්ස් රේ චායාරූපයකින් නොපෙනෙන, සැඟවුණු හෝ නිහඬ ක්ෂය රෝගය ආසාදනය බොහෝ පුද්ගලයන් තුළ තිබේ.

සැඟවුණු හෝ නිහඬ ක්ෂය රෝගය මගින් රෝග ලක්ෂණ ඇති නොකරන නමුත් පරීක්ෂණයකින් මාස හෝ අවුරුදු ගනනකට පසු එය සක්‍රීය සහ බෝවෙන ක්ෂය රෝගය දක්වා වර්ධනය වීමට පුළුවන..

## ඔස්ට්‍රේලියාවට පැමිණියාට පසු උපකාර ලබාගත හැකි මාර්ග

ඔබේ වෛද්‍යවරයාට, විශ්ව විද්‍යාල සෞඛ්‍ය සේවයට, හෝ ප්‍රාදේශීය රෝහලට කතා කිරීමෙන් ඔබට උපකාර ලබා ගත හැකිය. ඔබට කිසියම් ක්ෂය රෝගය රෝග ලක්ෂණයක් හටගෙන ඇත්නම් මේ තොරතුරු පත්‍රිකාව ඔබේ වෛද්‍යවරයාට පෙන්වන්න.

සතියේ දින හතේම, පැය විසි හතර පුරාම 1800 022 222 අංකය ඔස්සේ HealthDirect Australia අමතා ඔබට නොමිලේ සෞඛ්‍ය උපදෙස් ලබා ගැනීමට පුළුවන. (භූමිගත දුරකථන (landlines) ඇමතුම් නොමිලයේ වන අතර ජංගම දුරකථන ඇමතුම් සඳහා ගාස්තු අය වනු ඇත.)

*පහත සබැඳුම් ඔස්සේ ඔබේ ප්‍රාන්තයේ හෝ බල ප්‍රදේශයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට පිවිසෙන්න:*

- Australian Capital Territory: Tuberculosis (health.act.gov.au)
- Victoria: Tuberculosis (health.vic.gov.au)
- New South Wales: Tuberculosis (heath.nsw.gov.au)
- Queensland: Tuberculosis (health.qld.gov.au)
- Northern Territory: Tuberculosis (health.nt.gov.au)
- Western Australia: Tuberculosis (health.wa.gov.au)
- South Australia: Tuberculosis (sahealth.sa.gov.au)
- Tasmania: Department of Health (health.tas.gov.au/)

ඔබට ගිලන් රථයක් අවශ්‍යනම් හෝ ඔබේ අසනීපය උග්‍ර නම් හෝ ජීවිතයට තර්ජනාත්මක වේ යයි ඔබ සිතන්නේ නම්, ගිලන් රථයක් සඳහා වහාම 000 දුරකථන අංකය අමතන්න.